**සවියෙන් පෙරට - අපි එකට**

**e-ඉගෙනුම් පාසල**

**හොරණ අධ්‍යාපන කලාපය**

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 3. අපේ සංස්කෘතික උරුමය - ඇගයීම |

**සැකසුම: දිනූෂා සමරවීර**
**බප/හො/පලන්නොරුව ම.ම.වි**

1. සංස්කෘතික උරුමය යනු කුමක්ද?
2. සංස්කෘතික උරුමයන් ප්‍රධාන වශයෙන් වර්ග කළ හැකි ආකාර නම් කරන්න.
3. ස්පෘශ්‍ය උරුමය යනු කුමක්ද?උදාහරණ දෙන්න.
4. ලෝක සංස්කෘතික උරුමයන් ආරක්ෂා කිරීම සඳහා කටයුතු කරන ආයතනය කුමක්ද?
5. 2011 වසර වන විට එම ආයතනය මගින් ලෝක උරුම ලෙස හඳුනාගෙන ඇති සංස්කෘතික උරුමයන් ගණන කොපමණද?
6. එම ස්ථාන අතරින් ශ්‍රී ලංකාවේ පිහිටි ස්ථාන මොනවාද?
7. ලෝක උරුමයක් ලෙස හඳුනාගෙන ඇති සීගිරිය පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න.
8. යුනෙස්කෝ සංවිධානය විසින් විවිධ රටවල ලෝක සංස්කෘතික උරුම තෝරාගැනීමේදී සැලකිල්ලට ගන්නා කරුණු මොනවාද?
9. අස්පෘශ්‍ය උරුම යනු මොනවාද?
10. අස්පෘශ්‍ය උරුමයන් වර්ග කළ හැකි ප්‍රධාන ආකාර මොනවාද?
11. පහත සඳහන් අවස්ථා කෙටියෙන් හඳුන්වන්න.
    i)ජාත කර්ම
    ii)නාමකරණ
    iii)කර්ණවේදන
    iv)අන්නප්‍රාශන
    v)විද්‍යාරම්භ
12. රජරට ශිෂ්ටාචාර සමයේදී පැවැත්වූ පොදු උත්සව තුනක් නම් කරන්න.
13. අස්පෘශ්‍ය උරුමයන් ලෙස හඳුනාගෙන ඇති සම්ප්‍රදායික කලා ශිල්ප මොනවාද?
14. අපේ සංස්කෘතික උරුමයන් රැකගත යුත්තේ ඇයි?

සවියෙන් පෙරට - අපි එකට

**e**-ඉගෙනුම් පාසල

හොරණ අධ්‍යාපන කලාපය

| ශ්‍රේණිය | විෂයය | වාරය | පාඩම |
|---|---|---|---|
| 7 | ඉතිහාසය | 2 | 3. අපේ සංස්කෘතික උරුමය |



සැකසුම: දිනූෂා සමරවීර
බප/හො/ පලන්නොරුව ම. ම. වි.

# සංස්කෘතික උරුමය යනු..........

කිසියම් සමාජයක් දීර්ඝ කාලයක් තිස්සේ අඛණ්ඩව රැගෙන එන **දැනුම** හා එහි **භාවිතය** යි.

## දැනුම

ඒ ඒ සමාජයට ආවේණික සම්ප්‍රදායන්, සිරිත් විරිත් ,ඇදහිලි හා විශ්වාස, කලා ශිල්ප, කෞතුක වස්තූන්, ජන ගායනා, ජන නැටුම් හා ජන ශ්‍රැතිය.

## භාවිතය

සම්ප්‍රදාය මගින් උරුම කරන ලද දැනුම භාවිතය යි.

උදා:අත් බෙහෙත් , කෙම් ක්‍රම

# සංස්කෘතික උරුමයන් වර්ග කිරීම

- ස්පෘශ්‍ය උරුමය
- අස්පෘශ්‍ය උරුමය

# ස්පෘශ්‍ය උරුමය

- ස්පර්ශ කළ හැකි උරුමය යි.

උදා :

ස්මාරක

පොත්පත්

රජ මාළිගා

බලකොටු

වැව්

පොකුණු

ලී කැටයම්





# ලෝක සංස්කෘතික උරුමයන්

- සමස්ත මානව වර්ගයාටම අයත් පොදු උරුම ලෙස නම් කර ඇති ලෝකයේ විවිධ රටවල පිහිටි සුවිශේෂි **සංස්කෘතික හා ස්වාභාවික උරුමයන්** ය.



- උදා: චීන මහා ප්‍රාකාරය
  ටජ්මහල්



- මෙම උරුම හඳුනාගෙන ඇත්තේ යුනෙස්කෝ (UNESCO) සංවිධානය විසිනි.


| වර්ෂය | සංස්කෘතික උරුම ගණන |
|---|---|
| 2011 | 704 |
| 2019 | 869 |

- ශ්‍රී ලංකාවෙන් ලෝක උරුම ලෙස ස්ථාන 06 ක් හඳුනාගෙන ඇත.

| ස්ථානය | ලෝක උරුම ලැයිස්තුවට ඇතුළත් කළ වර්ෂය |
|---|---|
| අනුරාධපුර නගරය | 1982 |
| පොළොන්නරු නගරය | 1982 |
| සීගිරිය | 1982 |
| මහනුවර නගරය | 1988 |
| ගාල්ල කොටුව | 1988 |
| දඹුල්ල රජ මහා විහාරය | 1991 |

# ශ්‍රී ලංකාවේ සංස්කෘතික උරුම ස්ථාන

## අනුරාධපුර නගරය



# පොළොන්නරුව නගරය




# සීගිරිය



# විස්මිත සීගිරිය

- කාශ්‍යප රජු විසින් ගොඩනගන ලද බලකොටුවකි.
- සීගිරි කුරුටු ගී
- සීගිරි සිතුවම්
- සීගිරි උද්‍යානය
- සීගිරියේ පොකුණු හා ජල තාක්ෂණය






# මහනුවර නගරය



# ගාලු කොටුව



# දඹුල්ල රජ මහා විහාරය











# අස්පෘශ්‍ය උරුමය

- ස්පර්ශ කළ නොහැකි උරුමය යි.
- මේවා විවිධ ජන කණ්ඩායම් විසින් පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන එයි.
- උදා: ජන නැටුම්, ජන ගීත, විවිධ භාෂාවන්



- UNESCO සංවිධානය විසින් එම අස්පෘශ්‍ය උරුමයන් ක්ෂේත්‍ර 5 කට වර්ග කර ඇත.

**1.ජනවහර හා අදහස් ප්‍රකාශ කිරීම**

**2.රංග කලාව, ජන කවි, ජන සංගීතය**

**3.සමාජීය පුරුදු, ඇදහිලි, විශ්වාස හා උත්සව**


**4.ස්වභාවධර්මය හා බාහිර ආභාසයෙන් ඇතිවූ දැනුම හා පුරුදු**

**5.සම්ප්‍රදායික කලා ශිල්ප**

United Nations
Educational, Scientific and
Cultural Organization

# ජනවහර හා අදහස් ප්‍රකාශ කිරීම

- සිංහල භාෂාව (වසර 2000 ක් පැරණිය)




Brahmi to Present



# රංග කලාව ජන කවි ජන සංගීතය

## රංග කලාව

- මෙයට නැටුම්, ගැයුම්, තූර්ය වාදන අයත් වේ.
- උදා: මහනුවර දළදා පෙරහැර
  ශාන්ති කර්ම

## ජන කවි

- මුඛ පරම්පරාගතව පැවත එයි.
- උදා: පතල් කවි,පාරු කවි



# සිංහල ජන කවි

1. පාරු කවි
2. ගොයම් කවි
3. රබන් පද
4. පතල් කවි
5. පැල් කවි
6. කරත්ත කවි



# පාරු කවි

ඔන්න මලේ ඔය නා මල නෙලා වරෙන්
අත්ත බිදෙය පය බුරුලෙන් තබා වරෙන්
කළණි ගගේ ඔරු යනවා බලා වරෙන්
සාදු කාර දී ඔරුවක නැගී වරෙන්

සූරිය උදාවන තුරු පිනි බැවිල්ල
පාරුව පදින තුරු සයුරෙ සෙලවිල්ල
මාරුව බල බලා හිතයට කැරකිල්ල
කාරිය කෙරෙන තුරු කගෙත් රැවටිල්ල

මාතර ගගේ ඉන්නා කිඹුලිගේ පැටියා
තල්ල සුදුයි බෙල්ලලේ ගෝමර කැටියා
යන එන ඔරු පාරු නවතාගෙන සිටියා
මිනි නොකයි මාතර කිඹුලිගේ පැටියා

කන්දේ කකා ලන්දේ යන බෝසත්තු
අත මිණි බැද පය මිණි බැද ජයගත්තු
රාජ සබෙන් හොද කරුනා ලැබගත්තු
වලවේ ගගට බැස්සයි ගෝමර ඇත්තු

කරුවල තොටේ මම තනියම නාන කොට
සුරගන ලියක් ආවයි මගෙ ඉස්සරට
කරෙ තිබුනු මුතු දෙපොටේ ලස්සනට
අරන් යන්න හිතුනයි අගුලෙන් ගමට

බොඹු ඉදිලා දලුලාදෝ නොලාදෝ
කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ
කැළණි ගගේ ඔරු යාදෝ නොයාදෝ
කලුගෙ ණාගා මෙහි ඒ දෝ නොයේදෝ

සීරුව ලෙසට බඩු පටවා පිරෙන තුරු
වාරුව ඇතුව රිටි ගසමි යන අයුරු
පාරුව පදින මිනිසුන් පවසන මියුරු
පාරු මලෙ සිව්පද මේ අස මිතුරු

DSS

# සමාජීය පුරුදු, ඇදහිලි, විශ්වාස හා උත්සව

- පරම්පරාවෙන් පරම්පරාවට ගෙනයන ඇදහිලි පුරුදු හා විශ්වාසයන් ය.
- උදා :අත් සෝදා ආහාර ගැනීම

  විහාරස්ථානයකට ඇතුළු වීමේදී

  හිස්වැසුම් හා පාවහන් ගැලවීම



# උත්සව



- **නිවාස ආශ්‍රිතව**

    නම් තැබීම

    ඉඳුල් කටගෑම

    අකුරු කියවීම

    විවාහය



- **පොදු උත්සව**

    වෙසක් උත්සවය

    සිංහල හා හින්දු අලුත් අවුරුදු උත්සවය

# ස්වභාවධර්මය හා බාහිර ආභාසයෙන් ඇතිවූ දැනුම හා පුරුදු

- උදා: භෝග වැපිරීම

  වඩු කර්මාන්තය

  මැණික් කර්මාන්තය

  වැව් තැනවීම



# සම්ප්‍රදායික කලා ශිල්ප



- උදා: කැටයම් කලාව

  ලාක්ෂා කලාව

  වෙස් මුහුණු හා රූකඩ කලාව

  පිත්තල භාණ්ඩ තැනීම

  පැදුරු විවීම





# අපේ සංස්කෘතික උරුමය රැකගැනීම

- අනාගත පරපුරට දැනුම ලබාගැනීම.
- ශ්‍රී ලාංකික සංස්කෘතිය ලෝකය හමුවේ දැක්වීම.
- අපේ රට පිළිබඳ අභිමානයක් ඇතිවීම.